## රාජකීය විද්‍යාලය කොළඹ 07
## Royal College Colombo 07

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2010
**General Certificate of Education (Adv. Level) Examination, 2010**

13 වන ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය 2010 ජුනි
**Grade 13 – Final Term Test June 2010**

**කාලය: පැය 2 ½**

## සාමාන්‍ය පොදු පරීක්ෂණය

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1) 2001 වර්ෂයේදී ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත් කරන ලද 17 වන සංශෝධනයට අනුව ස්වාධීන කොමිෂන් සභා පහක් පිහිටු වීම එහි අරමුණ විය. පහත දැක්වෙන කවර පිළිතුරේ ඒවායින් දෙකක් අඩංගු වේද?
1. වෙළෙඳ කොමිෂන් සභාව හා අධිකරණ කොමිෂන් සභාව
2. අධිකරණ කොමිෂන් සභාව හා පොලිස් කොමිෂන් සභාව
3. මැතිවරණ කොමිෂන් සභාව හා පොලිස් කොමිෂන් සභාව
4. අධ්‍යාපන කොමිෂන් සභාව හා මාධ්‍ය කොමිෂන් සභාව
5. අධ්‍යාපන කොමිෂන් සභාව හා මැතිවරණ කොමිෂන් සභාව

2) ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික යන අංශ දෙකටම අයත් බලපත්‍ර ලාභි වාණිජ බැංකු රාශියක් දැකිය හැක. පහත දැක්වෙන කවරක පෞද්ලික වානිජ බැංකු පමණක් ඇතුලත් වේද?
1. සම්පත් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, මහජන බැංකුව
2. යූනියන් බැංකුව, ලංකා බැංකුව, සම්පත් බැංකුව
3. පෑන් ඒෂියා බැංකුව, ලංකා බැංකුව, සෙලාන් බැංකුව
4. නැෂනල් මර්චන්ට් බැංකුව, මහජන බැංකුව, සෙලාන් බැංකුව
5. හැටන් නැෂනල් බැංකුව, සම්පත් බැංකුව, සෙලාන් බැංකුව

3) දකුණු ආසියානු නිදහස් වෙළෙඳ ගිවිසුමට මෑතකදී එකතු වූ රට වන්නේ (SAFTA),
1. ශ්‍රී ලංකාව
2. නේපාලය
3. බංගලිදේශය
4. පකිස්ථානය
5. ඇෆ්ගනිස්ථානය

4) පහත දැක්වෙන විදෙස් මුදල් ඒකක අතරින් වර්තමානයේදී ශ්‍රී ලංකා රුපියල් වලින් වැඩිම අගයක් ඇත්තේ කිනම් මුදල් ඒකකයටද?
1. බ්‍රිතාන්‍ය ස්ටර්ලින් පවුමට
2. යුරෝවට
3. එක්සත් ජනපද ඩොලරයට
4. ඔස්ට්‍රේලියානු ඩොලරයට
5. ජපන් යෙන් සියයකට

5) එක්සත් ජාතින්ගේ පරිසරය හා සංවර්ධනය පිළිබඳව වූ සමුළුව හැඳින්වෙන්නේ කවර නමකින්ද?
1. සාර්ක් සමුළුව
2. මිහිකත සමුළුව
3. නොබැඳි සමුළුව
4. G – 15 සමුළුව
5. ජිනීවා සමුළුව

**අංක 6, 7 යන ප්‍රශ්නවල පද යුගල 5ක් දී ඇති අතර ඉන් හතරක් යම් යම් හේතු මත සම්බන්ධතාවක් දක්වයි. එකක එවැනි සම්බන්ධතාවක් පෙන්නුම් නොකරයි. එය තෝරන්න.**

6) 1. දෙල් මැල්ලුම්
2. පිට්ටු කිරි
3. පාන් ජෑම්
4. මී කිරි පැණි
5. ඉදිආප්ප සම්බෝල

7) 1. පොල් කොප්පරා
2. ගොයම් ගස පිදුරු
3. ඉස්ගෙඩියා ගෙම්බා
4. මාලු කරවල
5. කොස් ඇට අටු කොස්

**අංක 8,9 ප්‍රශ්ණ වල අර්ථවත් වාක්‍යයන් කොටස් හයකට කඩා දක්වා තිබේ. එම වාක්‍ය වල මුල් කොටස A ද අවසාන කොටස F ලෙස ද දක්වා ඇත. ඉතිරි කොටස් BCDE යනුවෙන් නොගැලපෙන ලෙස දක්වා තිබේ. අර්ථවත් වාක්‍යයන් ගොඩනැගෙන ආකාරයට ගැලපු විට අදල පිළිතුර වන්නේ,**

8) A. ලෝකයේ බොහෝ ධනවාදි
F. නිතර දැකිය හැකි ලක්‍ෂණයකි.
B. එම ආර්ථිකයන් හි
C. ආර්ථිකයන්ට, අර්බුද සුලභ සිද්ධියක්
D. නිසා හටගන්නා මූල්‍ය අස්ථාවරත්වය
E. වන අතර ක්‍ෂණිකව වෙනස් වන ක්‍රියාකාරිත්වය

1. CEDB 2. DCBE 3. CEBD 4. BDCE 5. BCED

9) A. සංවර්ධනය වෙමින් පවතින
F. වෙනස්වීමක් දකින්නට ලැබේ.
B. සංවර්ධන විෂයෙහි ප්‍රමුඛතාවන්හි
C. කටයුතු වල ව්‍යාප්තියන් සමඟ
D. බොහෝ රටවල මෑත කාලයෙහි
E. සිදුවූ මානව සංවර්ධන

1. DCEB 2. CEDB 3. DEBC 4. DBCE 5. DECB

10) පහත දැක්වෙන ප්‍රකාශයේ අඩංගු අදහසට සමාන අදහසක් දැක්වෙන ප්‍රකාශය දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.

**කබලෙන් ලිපට වැටුනා**

1. අලි මදිවට හරක්
2. කොරේ පිටට මරේ
3. සීනි දී හකුරු ගත්තා
4. ඉඟුරු දී මිරිස් ගත්තා
5. ගහෙන් වැටුනු මිනිහට ගොනා ඇන්නා

11) මොටර් රථ සඳහා අංක ලබාදෙන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව 500600 දක්වා අංක දීමට සිදුවූ අවස්ථාවක අංක වල එකතුවට 9 ලැබෙන සංඛ්‍යා ගැනීමට කවුරුත් කැමැත්ත දක්වූයේ නැත. එවැනි අංක කොපමණ ඒ අතර වීද
1. 16 කි 2. 13 කි 3. 11 කි 4. 7 කි 5. 5 කි

12) අනුගාමී සංඛ්‍යා තුනක එකතුව 18 කි. ඒවායේ ගුණිතය 210 කි. එම සංඛ්‍යා තුන වන්නේ,
1. 5, 6, 7  2. 4, 5, 6  3. 6, 7, 8  4. 3, 4, 5  5. 2, 3, 4

13) සුනිල්ගේ පියාගේ වයස සුනිල්ගේ වයස මෙන් තුන් ගුණයකි. තව අවුරුදු 10 කින් සුනිල්ගේ ගේ පියාගේ වයස අවුරුදු 40 ක් වන්නේ නම් අවුරුදු 5කට ඉහතදී සුනිල්ගේ වයස කීයද?
1. අවු. 01  2. අවු. 05  3. අවු. 07  4. අවු. 10  5. අවු. 12

14) පහත දැක්වෙන මුල් සිංහල පද තුන ඉලක්කම් වලින් සැකසූ රහස් බසකට පෙරලා තිබේ. එය තේරුම් ගෙන හතරවන සිංහල පදයට අදාල රහස් පදය තෝරා එයට නියමිත අංකය තෝරන්න.

| | | | |
|---|---|---|---|
| ණයබර | 1, 2, 4, 3 | මල්දම | 8, 0, 7, 8 |
| වඩුගම | 8, 9, 6, 5 | බණමඩුව | |

1. 56832  2. 56432  3. 23865  4. 32685  5. 59832

**අංක 15, 16 යන ප්‍රශ්ණ වල දී ඇති සංඛ්‍යා අතර සම්බන්ධතාවය තේරුම් ගෙන හිස්තැනට සුදුසු අංකය තෝරන්න.**

15)




1. 4  2. 6  3. 12  4. 8  5. 16

16)

| | |
|---|---|
| 9 | 12 |
| 3 | 18 |

| | |
|---|---|
| 13 | 32 |
| 26 | 19 |

| | |
|---|---|
| 1 | … |
| 4 | 7 |

1. 15  2. 10  3. 9  4. 8  5. 6

17) එක්තරා භාණ්ඩයක් වෙළෙන්දෙකු ගෙන් මිලටගෙන ඇත්තේ රු. 9000 ය. වෙළෙන්ද එය විකුණා ඇත්තේ 25% ක ලාභයක් ඇතිවය. නිෂ්පාදකයා එය වෙළෙන්දට විකුණා ඇත්තේ 20% ක ලාභයක් ඇතිවය. එම භාණ්ඩයේ නිෂ්පාදන වියදම වන්නේ,
1. 4400  2. 5000  3. 5500  4. 7200  5. 6000

18) යතුරු පැදියකට ඉන්ධන ලීටරයකින් කිලෝමීටර් 40ක් ගමන්කළ හැක. ඉන්ධන ලීටරයක මිල රු. 100 සිට 120 දක්වා වැඩි වුනි නම් එම යතුරු පැදියට කිලෝ මීටර 60 ක දුරක් යෑමේදී පෙරට වඩා කොපමණ මුදලක් වැයවේද?
1. රු. 30  2. රු. 20  3. රු. 36  4. රු. 40  5. රු. 24

**අංක 19 සහ 20 ප්‍රශ්න පදනම් වන්නේ පහත දැක්වෙන විස්තර මතය.**

අවමගුලකට උදව් වීමට ගිය අසේල, අමල්, කමල්, සුදත්, නිලුක් සහ ප්‍රසාද් යන අයගෙන් එක් අයෙකු කිසිදු බීමක් පානය කළේ නැත. අමල් හා කමල් කෝපි පානය කළෝය. අසේල හා නිලුක් තේ පමණක් පානය කළේය. අමල් හා සුදත් යන අයගෙන් එක් අයෙක් පැණි බීම පානය කරන ලදී.

19) පැණි බීම පානය කළේ කවුද?
1. අසේල  2. අමල්  3. සුදත්  4. නිලුක්  5. ප්‍රසාද්

20) කිසිදු බීමක් පානය නොකළ අය කවුද?
1. කමල්  2. සුදත්  3. නිලුක්  4. අසේල  5. ප්‍රසාද්

**අංක 21, 22 යන ප්‍රශ්න සඳහා පහත දැක්වෙන විස්තරය පදනම් කරගන්න.**

උදේ 9.05 සිට සෑම පැය තුනකටම වරක් 21.05 දක්වා කොළඹ සිට ගාල්ලට දුම්රියක් බැගින් පිටත්වේ. උදේ 6.00 සිට 18.00 දක්වා සෑම පැය තුනකට වරක් ගාල්ලෙන් දුම්රියක් කොළඹ බලා පිටත්වේ. එක් ගමනකට දුම්රියට ගත වන්නේ පැය තුනකි.

21) ගාල්ල සිට කොළඹ බලා එන කොපමණ දුම්රිය ප්‍රමාණයක් කොළඹ සිට ගාල්ල බලා යන දුම්රියට හමුවේද?
1. 2 කි 2. 3 කි 3. 4 කි 4. 5 කි 5. 6 කි

22) ගාල්ලෙන් හා කොළඹින් පිටත්වූ දුම්රියන්ගේ එකතුව කොපමණද?
1. 6 කි 2. 7 කි 3. 8 කි 4. 9 කි 5. 10 කි

**අංක 23, 24 යන ප්‍රශ්න සඳහා පහත දී ඇති අංක අතර සම්බන්ධතාව තේරුම් ගෙන හිස්තැනට අදාල අංකය දී ඇති පිළිතුරු වලින් තෝරන්න.**

23)

| | | |
|---|---|---|
| 30 | 34 | 38 |
| 13 | ….. | 55 |

1. 16 2. 28 3. 32 4. 34 5. 23

24)

| | | |
|---|---|---|
| 5 | 150 | 3 |
| 2 | ….. | 2 |

1. 40 2. 20 3. 10 4. 30 5. 25

25) වෙළෙන්දෙකු ලඟ රු. 100 ට තුන බැගින්, රු. 250 ට අට බැගින් හා රු. 500ට 14 බැගින් වූ පේර වර්ග තුනක් වේ. ඔහුගෙන් රු. 1000 කට ගත හැකි උපරිම පේර ගණන කීයද?
1. 24 2. 28 3. 30 4. 32 5. 40

**අංක 26, 27, 28 යන ප්‍රශ්න සඳහා පහත විස්තරය පදනම් වේ.**

මුදල් ලැබෙන යන්ත්‍රයකට යම් මුදලක් දමා කැරකූ විට,
A පෙන්නුම් කිරීමේදී දැමූ මුදල මෙන් දෙගුණයක් ද
B පෙන්නුම් කිරීමේදී දැමූ මුදල අහිමි වීමක් ද
C පෙන්නුම් කිරීමේදී දැමූ මුදල මෙන් අඩක් ද
D පෙන්නුම් කිරීමේදී දැමූ මුදල මෙන් තුන් ගුණයක් ද හිමිවේ.
පහත සඳහන් අවස්ථාවන්හිදි මුදල් යන්ත්‍රයේ පෙන්නුම් කරන ලද අක්ෂර අඩංගු පිළිතුර තෝරන්න.

26) සිල්වා මහතා රු. 10 බැගින් තුන් වරක් දැමීමෙන් රු. 45 ක් හිමි විය.
1. A B D 2. B A C 3. A A B 4. A B A 5. A A C

27) පෙරේරා මහතා රු. 20 බැගින් දෙවරක් දැමීමෙන් රු. 70 හිමි විය.
1. AD 2. DC 3. AB 4. BD 5. AC

28) ගුණරත්න මහතා රු. 100 බැගින් තුන්වරක් දැමීමෙන් රු. 50 හිමි විය.
1. A B C 2. B C D 3. A C A 4. A B D 5. B C B

**අංක 29, 30 යන ප්‍රශ්න සඳහා පහත විස්තරය පදනම් වේ.**

පහත දැක්වෙන ප්‍රශ්න වල මුල් සිංහල පද තුන එක්තරා රහස් බසකට පෙරලා තිබේ. එය තේරුම් ගෙන හතරවන පදයට අදාල රහස් පදය දී ඇති පිළිතුරු වලින් තෝරන්න.

29) පරිසරය A B C D E  සරණාගත F G H B C
විපරිතය A F J E K  රණවිපත …………..

1. C D B J A  2. K A G A B  3. H E K B F  4. E F A H B  5. F E K H B

30) පරලොව 2 5 0 8 9  පරසතු 2 5 4 6
වතුරට 9 6 5 7  රතුවෙලා …………

1. 5 6 9 0 8  2. 5 9 6 0 8  3. 6 5 0 9 8  4. 5 6 0 9 8  5. 8 9 0 6 5

**අංක 31, 32 ප්‍රශ්න වලදී දී ඇති සංඛ්‍යා අතර සම්බන්ධතාව තේරුම් ගෙන හිස්තැනට සුදුසු අංකය අඩංගු පිළිතුර දී ඇති පිළිතුරු වලින් තෝරන්න.**

31)




1. 0  2. 1  3. 2  4. 3  5. 4

32)




1. 20  2. 18  3. 14  4. 9  5. 7

**අංක 33, 34 යන ප්‍රශ්න සඳහා පහත විස්තරය පදනම් කර ගන්න.**

එක්තරා දුරක් යාමට පයින් යන කෙනෙකු ගන්නා වේලාවෙන් $\frac{1}{3}$ ක් පාපැදි කරුවෙකුට ගතවේ. එම දුර යාමට පාපැදියකු ගන්නා වේලාව මෙන් $\frac{1}{3}$ ක් යතුරු පැදියකට ගතවේ. ඒ අනුව කිලෝමීටර් 27 දුර යාමට යතුරු පැදියකට පැය $\frac{1}{2}$ ක් ගතවේ.

33) පයින් යන මිනිසාට ගතවන කාලය කොපමණද?

1. පැය $1\frac{1}{2}$  2. පැය $3\frac{1}{2}$  3. පැය 4  4. පැය $4\frac{1}{2}$  5. පැය 5

34) පා පැදිකරුගේ වේගය පැයට කිලෝමීටර කීයද?
1. 18 2. 16 3. 12 4. 10 5. 6

**අංක 35, 36 යන ප්‍රශ්න සඳහා පහත විස්තරය පදනම් කර ගන්න.**

මේසය උඩ කහ, නිල්, දම්, රතු, සුදු හා කොළ පාට පීරිසි හයක් එක උඩ එක තබා තිබේ. නිල් පීරිසිය ඇත්තේ උඩින්ම හෝ යටින්ම නොවේ. කහ පීරිසිය දම් පීරිසියට උඩින් ව ඊට ආසන්නයේ තිබුණ ද රතු සහ නිල් පීරිසි වලට පමණක් පහලින් විය. කොළ පීරිසිය කහ පීරිසියට පහලින් විය.

35) උඩින්ම තිබූ පීරිසියේ පාට කවරේද?
1. සුදු 2. රතු 3. නිල් 4. කොළ 5. දම්

36) පහලින්ම තිබූ පීරිසියේ පාට කවරේද?
1. නිල් 2. දම් 3. කහ 4. කොළ 5. සුදු

37) ශ්‍රී ලංකාවෙහි මරණ බොහෝමයක් ඇතිකළ ඩෙංගු රෝගය පතුරුවන මදුරු විශේෂය බෝවීමට සුදුසු තැනක් නොවන්නේ,
1. ගෙවත්තේ දමා ඇති හිස් පොල් කටුය.
2. ගෙවත්තේ දමා ඇති හිස් ටින්ය.
3. ගෙවත්තේ දමා ඇති ටයර්ය.
4. ගලා බසින ගංගාය.
5. ගෙවල් තුල ඇති වතුර සහිත මල් බඳුන්ය.

38) යම් පුද්ගලයකුගේ අනන්‍යතාව ඔප්පු කිරීමට යොදගත හැකි විශ්වාස කටයුතුම විද්‍යාත්මක පරීක්ෂණය කුමක්ද?
1. ඇඟිලි සලකුණු පරීක්ෂණය
2. X - කිරණ පරීක්ෂණය
3. අති ධ්වනි පරිලෝකන පරීක්ෂණය
4. රුධිර පරීක්ෂණය
5. D N A (ඩී එන් ඒ) පරීක්ෂණය

39) ලෝකයේ වැඩියෙන්ම අලෙවි වූ ගීත ඇල්බමය (එකතුව) නිර්මාණය කළ ගායකයා මෑත දී දැඩි මහජන අවධානයට යොමු විය. ඒ කවරෙක්ද?
1. එල්විස් ප්‍රේස්ලි
2. මයිකල් ජැක්සන්
3. ජිම් රිව්ස්
4. ජේ වට්
5. ජෝන් ලෙනන්

40) පහත සඳහන් ඒවා අතරෙන් පරිසරයට හානිකර නොවන්නේ කුමක්ද?
1. පෘථිවි ගෝලය උණුසුම් වීම.
2. ජනගහනය සීඝ්‍රයෙන් වර්ධනය වීම.
3. නිර්මාංශ ආහාර පරිභෝජනය.
4. රථ වාහන වලින් නික්මෙන සෝෂාව.
5. ඕසෝන ස්ථරය ක්ෂය වීම.

41) මෙහි දැක්වෙන රූපයේ ත්‍රිකෝණ ඇත්තේ,



1. 6
2. 8
3. 9
4. 10
5. 12

**අංක 42, 43 යන ප්‍රශ්න සඳහා පහත රූපය භාවිතා කරන්න.**




මෙහි දක්වෙන රූපය පාට කළ යුතුව ඇත්තේ යාබද පෙදෙස් දෙකක් එකම පාටකින් යුක්ත නොවන පරිද්දෙකි. ඒ සඳහා රතු, නිල්, කොළ, කහ යන පාට පමණක් යොදා ගත යුතුවේ. එහි සමහර කොටස් වල පාට දක්වා ඇත.

42) A සඳහා යෙදිය යුතු පාට කුමක්ද?
1. නිල් 2. කහ 3. කොළ 4. රතු
5. කිසිදු පාටක් යෙදිය නොහැක.

43) B සඳහා යෙදිය යුතු පාට කුමක්ද?
1. කහ 2. කොළ 3. රතු 4. නිල්
5. කිසිදු පාටක් යෙදිය නොහැක.

**අංක 44, 45 යන ප්‍රශ්න සඳහා පහත විස්තරය පදනම් වේ.**

පහත ප්‍රශ්න දෙකෙහිම මුල් රූපයේ දිග හරින ලද පෙට්ටියක් පෙන්නුම් කරයි. එහි පැතිවල මූණත් වල අංක කිපයක් යොදා ඇත.

44)




ඉහත පෙට්ටියේ පෙන්නුම් කරන අංක පිහිටා ඇති රූපය තෝරන්න.

1. 


2. 


3. 


4. 


5. 


45)




ඉහත පෙට්ටියේ පෙන්නුම් කරන අංක පිහිටා ඇති රූපය තෝරන්න.

1. 


2. 


3. 


4. 


5. 

අංක 46, 47 යන ප්‍රශ්න සඳහා පහත වට ප්‍රස්ථාරය පදනම් වේ.




46) එලවලු හා පලතුරු වගාකල ප්‍රතිශතය මුළු වගාවෙන් ආසන්න වශයෙන් කොපමණද?
1. 19% 2. 37% 3. 45% 4. 50% 5. 62%

47) එලවලු හා පලතුරු වගාකල පෙදෙස ආසන්න වශයෙන් හෙක්ටාර 370 ක් නම් තේ වගාකල හෙක්ටාර ප්‍රමාණය කොපමණද?
1. 245 2. 278 3. 300 4. 350 5. 370

අංක 48, 49 ප්‍රශ්න පදනම් වන්නේ පහත දැක්වෙන වට ප්‍රස්ථාරය පදනම් වේ.




ළමුන් රාත්‍රි අනුභව කළ දේ හා ළමුන් ප්‍රමාණය




ඒ ඒ ආහාර සඳහා වැයවූ මුදල

48) දළ වශයෙන් ළමුන්ගෙන් කවර ප්‍රතිශතයක් ඉදි ආප්ප අනුභව කරන ලද්දේ ද?
1. 11% 2. 22% 3. 28% 4. 33% 5. 40%

49) මේ ළමුන් ගන්නා ලද ආහාර වලින් අඩු මුදලකට ලැබූ ආහාර වේල කුමක්ද?
1. පාන් 2. ඉදි ආප්ප 3. පිට්ටු 4. බත් 5. ආප්ප

50) මෙම ප්‍රකාශ අතරින් පෞද්ගලික මත වාදයක් දැක්වෙන්නේ කවරක්ද?
1. ගහ දන්නාට කොළ කඩා පෑ යුතු නැත.
2. වෙසක් දර්ශණ බැලීමට පයින් යෑම වඩා සුදුසුය.
3. පොල්තෙල් වල මේදය බහුලව ඇත.
4. අපවිත්‍ර ජල කානුවල මදුරුවන් බෝවේ.
5. වාහන වලින් පිටකරන දුම් පරිසරය අපිරිසිදු කරයි.

51) පෙරේරා මහතා හතර දෙනෙකුට සංග්‍රහ කිරීම සඳහා දහ දෙනෙකුට සෑහෙන ආහාර පිළියෙල කෙරුවේය. මෙහි දැක්වෙන අදහස වඩාත් තහවුරු වන්නේ පහත සඳහන් ඒවා අතරින් කවරකින්ද?
1. රෙද්දේ තරමට හැට්ටය කපන්න.
2. උඩ බලා කෙල ගහ ගත්තා.
3. ඇලියාගේ දේ කුහුඹියා කයි.
4. හිඟන්නාගේ පාත්‍රයේ වැලි
5. රෑ වැටුණු වලේ දහවල් වැටුණි.

52) පහත දැක්වෙන ප්‍රකාශයේ අඩංගු අදහසට සමාන අදහස් දැක්වෙන ප්‍රකාශය දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.

**"තට්ටු කරන්නාට දොර ඇරේ"**

1. දොර අරින්නාට තට්ටු වේ.
2. උඩ පැන්නොත් බිම වැටේ.
3. උත්සහවන්තයා ජය ගනී.
4. කළ කළ දේ පළ පල දේ
5. අනුන්ට කළ දේ තමන්ට පල දේ

53) පහත දැක්වෙන ප්‍රකාශයේ අඩංගු අදහසට සමාන අදහසක් දැක්වෙන ප්‍රකාශය දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.

**"හොඳින් පාඩම් කරයි. විභාගය සමත් වෙයි"**

1. නැලවිලි ගී ගයයි ළදරුවා නැලවෙයි.
2. පැලයක් සිටුවයි ඵලයක් ලබයි.
3. හිරු බැසයයි අඳුර ඇතිවෙයි.
4. පියා පහරදෙයි පුතා අඬයි.
5. ගොයමට සාත්තුව වැඩි කරයි අස්වැන්න සරුවෙයි.

**අංක 54, 55 ප්‍රශ්න වලපද යුගල හතරක පොදු සම්බන්ධතාවයක් ඇත. එකක එවැනි සම්බන්ධතාවක් දක්නට නොලැබේ එම පද දෙක කුමක්ද?**

54) 1. ගියේය : නැටුවාය
2. නැවාය : කෑවාය
3. බලමු : කරන්න
4. ගැයුවේය : දුන්නේය
5. ආවා : නැසුනා

55) 1. මැටි නැබිලිය
2. ඇලුමිනියම් කේතලය
3. රත්‍රං වලල්ල
4. පිටි පාන්
5. වීදුරු බෝතල්

**අංක 56, 57 ප්‍රශ්න පදනම් වන්නේ පහත දැක්වෙන විස්තරය මතය.**

උතුර, දකුණ, බටහිර හා නැගෙනහිර දිශාවලට දිවෙන පාරවල් සම්බන්ධවන හතරමං හන්දියක සිටි A B C D E හා F යන යුධ භටයින් හය දෙනාගෙන් දෙදෙනෙක් එක් දිශාවකටද තව දෙදෙනෙක් තවත් දිශාවකටද තවත් දෙදෙනෙක් ප්‍රතිවිරුද්ධ දිශා වලටද ගමන් කළහ. A සමග සිටි අනෙකා ගමන් කළේ නැගෙනහිරටය. B සමග සිටි අනෙකා ගමන් කළේ බටහිරටය. D දකුණට ගමන් කළේ නැත. F යන අය Cට හා Aට ප්‍රතිවිරුද්ධ අතට ගමන් කළේය.

56) දකුණු දිශාවට ගමන් කළේ කවුරුන්ද?
1. A 2. B 3. C 4. D 5. E

57) F ගමන් කළේ කවර දිශාවටද?
1. උතුර
2. දකුණ
3. බටහිර
4. නැගෙනහිර
5. කිව නොහැක

**අංක 58, 59 ප්‍රශ්න පදනම් වන්නේ පහත දැක්වෙන විස්තරය මතය.**

එක්තරා සමාගමක A B C E F සහ G නැමැති සේවකයන් හත් දෙනෙකුගේ වාර්ෂික වැටුප පිළිබඳ විස්තර පහත දැක්වේ.

* G ගේ වැටුප F ගේ වැටුප මෙන් තුන් ගුණයකි.
* D ගේ වැටුප අන් සියලු දෙනාගේ වැටුප් වලට වඩා අඩුය.
* A ගේ හා C ගේ වැටුප් සමානය
* B ගේ වැටුප F හා G ගේ වැටුප් වල එකතුවට සමානය.
* E ගේ වැටුප A,B සහ G ගේ වැටුප් වල එකතුවට සමානය.
* C ගේ වැටුප B සහ G ගේ වැටුප් වල එකතුවට සමානය.

58) සේවකයන් සියලු දෙනා අතරෙන් වැඩිම වැටුප ලබන්නේ කවරෙක්ද?
1. A 2. B 3. C 4. E 5. F

59) පහත සඳහන් කිනම් තිදෙනාගේ මුළු වැටුප E ගේ වැටුපට සමාන ද?
1. A C හා G 2. C G හා F 3. B C හා G 4. G F හා D 5. B G හා F

60) නළ ජලයට විෂක් මිශ්‍රවී ඇතැයි ආරංචියක් පැතිර ගියහොත් සිදු විය හැකි යැයි සැක කළ හැකි ප්‍රතිවිපාක කීපයක් පහත දැක්වේ.

A. මිනිසුන් ජලය පරිහරණයෙන් වැළකී සිටිනු ඇත.
B. පානය කරනු ලබන ජලය හොඳින් රත්කර පෙරා බීමට පෙළඹෙනු ඇත.
C. ළිං හැරීමට උත්සුක වනු ඇත.
D. ජල සම්පාදන මණ්ඩලයට විරුද්ධව ඒකරාශිවනු ඇත.
E. ජලය ගලා එනු ලබන නිවසේ ප්‍රධාන කරාමය හැකි ඉක්මනින් වසනු ඇත.

ඉහත දැක්වෙන ප්‍රතිවිපාක අතරින් සිදුවෙතැයි සැක කරන සත්‍ය වශයෙන් හා ඉතා ඉක්මනින් ඇති විය හැකි ප්‍රතිවිපාක යුගලය අඩංගු පිළිතුර කුමක්ද?
1. BE 2. BD 3. AE 4. BC 5. DE